**ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

-----------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශිර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---------------------

ශිර්ෂය 224- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

-----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1)- ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධාන වලට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. ලේඛන හා පොත් පවත්වා නොතිබිම<br>2. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන්<br>3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.12<br>2.1 (ඇ)<br>2.3.1 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම | 1. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන්<br>2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.1 (ඇ)<br>2.3.1 |

| | | | |
|---|---|---|---|
| | රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඈ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>2. අනුකූල නොවීම් | 2.12<br>2.13 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු<br>2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10 (අ),(ආ)<br>2.11 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යෝක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4(අ),(ආ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම<br>2. වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම. | 2.9 (අ) (i)<br>2.2 |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන | ආදායම් ගිණුම සම්බන්ධ අඩුපාඩු | 2.10 (ආ) ii |

| | | | |
|---|---|---|---|
| | ගණන්දීමේ නිලධාරියාට යවන බව | | |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | 1. ආදායම් ගිණුම්වල වූ අඩුපාඩු<br>2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.10 (අ) (i)<br>2.10 (ආ) (i)<br>2.11 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | 1. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන් ඉටු කිරීම<br>2. අවිධිමත් ගනුදෙනු<br>3. විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.1 (ඇ)<br>2.6<br>2.9 (අ) |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව. | 1. පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම<br>2. වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම<br>3. පාඩු හා හානි<br>4. හානි පිළිබඳ වගකීම | 2.4 (අ)<br>2.6<br>2.7<br>2.8 |

**මුදල් රෙගුලාසි 128(2) - රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය**

---------------------------------------------

| | | | |
|---|---|---|---|
| 128(2)(ඇ) | ආදායම් සංකේතයට අදාළව මුදල් වර්ෂයේ ජුනි 30 දිනට හා දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් තත්ත්වය පෙන්නුම් | අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා නියමිත දිනයට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2.10 (ආ) |

කරන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම.

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**කාර්යභාරයන් ඉටු නොකිරිම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණි. කෙසේ නමුත් අදාල ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව කාර්යයන් ඉටුකර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කාර්යයන් ඉටු නොවීම**

2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ක්‍රියාකාරි සැලැස්ම අනුව හිගුරක්ගොඩ මූලික කඳවුරේ නව ඉදිකිරීම් ලෙස හඳුනාගෙන තිබුණු ඉදිකිරීම් කටයුතු 06 ක් අතුරින් ව්‍යාපෘති දෙකක කටයුතු පමණක් සමාලෝචිත වර්ෂය තුලදී නිම කර තිබුණු බව නිරීක්ෂණය විය. ප්‍රවර්තන වර්ෂයේ දෙවන කාර්තුව වනවිට වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණු ඉතිරි ඉදිකිරීම් 4 ක කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. හිගුරක්ගොඩ මූලික කඳවුරෙහි ඉදිකිරීම් සඳහා රු.මිලියන 5.55 ක් පමණක් වෙන්කර තිබීම හේතුවෙන් ඒවායේ කටයුතු සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ නොකරන ලද බව ගුවන් හමුදාපති විසින් පැහැදිලි කර තිබුණි.

**(ආ)** උක්ත කරුණට අමතරව හිඟුරක්ගොඩ ගුවන් හමුදා මූලික කඳවුර මගින් 2017 වර්ෂයේ ගොඩනැගිලි අළුත්වැඩියා සහ වැඩිදියුණු කිරිමට අපේක්ෂිත වැඩසටහන් 13 ක් වෙනුවෙන් රු. මිලියන 809.67 ක ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලුම්කර තිබුණත්, ක්‍රියාකාරී සැලැස්ම මගින් රු.මිලියන 10 ක් පමණක් වෙන්කර තිබුණි. කෙසේ වුවත් ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 16.56 ක් වූ වැඩසටහන් 6 ක වැඩ කටයුතු සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ කර තිබුණි.

**(ඇ) අපේක්ෂිත ප්රතිලාභ ලබානොගැනීම**

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් මෙන්ම අරමුදල් උපයෝගි කර ගනිමින් පෞද්ගලික සමාගමක් වශයෙන් පවත්වාගෙන යනු ලබන හෙලිටුවර්ස් සමාගම 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වසර 9 ක කාලයක් තුල රු.මිලියන 54.5 ක ලාභයක් උපයාගෙන තිබුණු නමුත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදුකල ආයෝජනයට කිසිදු ප්‍රතිලාභයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි.

## 2.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සමාලෝචිත වර්ෂය සඳහා සැපයීම් හා සේවා වෙනුවෙන් රු. මිලියන 6073.9 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 4927.9 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,146 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 18.86 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### 2.3.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ MI-17 හෙලිකොප්ටර් එන්ජින් 5 ක් කටුනායක ගුවන් තොටුපළේ සිට රුසියාවේ Koltsovo ගුවන් තොටුපොළ දක්වා ප්‍රවාහනය කිරීම සඳහා සීමිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ 2017 අප්‍රේල් 17 දින මිල ගණන් කැඳවා තිබුණු අතර 2017 මැයි 18 දින පැවැත්වූ ප්‍රසම්පාදන කමිටු අනුමැතියට යටත්ව ලංසු ඉදිරිපත් කර තිබුණු පෞද්ගලික සමාගමක් වෙත ප්‍රසම්පාදන කටයුත්ත පවරා තිබුණි. ආයතනයෙන් අදාල සේවාවන් සපයා ගැනීම සඳහා එකතුව රු.1,658,000 ක්වූ ඇණවුම් 5 ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉදිරිපත් කර තිබුණු නමුත් සැපයුම්කරු විසින් අදාල සේවාව සැපයීම සඳහා රු.1,145,830 ක අමතර මුදලක් ගෙවන ලෙස පසුව දන්වා තිබුණි. ලංසු කැඳවීමේ ලේඛනවල අතිරේක මිල වැඩිකිරීම් සඳහා වූ ඉල්ලීම් පිළි නොගන්නා බව පැහැදිලිව දක්වා තිබියදී 2017 ජූනි 28 දින එම අතිරේක පිරිවැයන්ද ඇතුලත්ව සැපයුම්කරු වෙත ගෙවීම් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කටුනායක මූලික කඳවුරේ සැපයුම් හා නඩත්තු අංශයේ රෙදිපිළි ගබඩාව තුල සමාලෝචිත වර්ෂය ආරම්භය වන විට Material drill Khaki වර්ගයේ රෙදි මීටර 23,382 ක තොග ශේෂයක් පැවති නමුත් වර්ෂය තුල රු.22,418,055 ක් වටිනා රෙදි මීටර 61,948 තොගයක් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුල නිකුත් කර තිබුණේ රෙදි මීටර 26,548 ක් පමණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගබඩාව තුල රු.21,468,234 ක් වටිනා රෙදි මීටර 58,782 ක තොගයක් පැවති බව නිරීක්ෂණය විය. ප්‍රමාණවත් රෙදි තොග අත ඉතිරිව තිබියදී වර්ෂය තුලදී එම වර්ගයේ රෙදි මිලදී ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් විශාල රෙදි තොගයක් ගබඩා තුල ඉතිරිවී පැවති බව අනාවරණය විය.

**(ඇ)** ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කඳවුරු 25 ක් සඳහා ලෙලි රහිත පොල් මිලදී ගැනීම සඳහා කිලෝග්‍රෑම් එකකට ගිවිසුම්ගත මිල රු.39.20 සිට රු.41.00 ක් දක්වා වූ පරාසයක පැවති නමුත් 2017 ජූනි 16 දින ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම ගිවිසුම්ගත මිල රු.65 දක්වා පසුව වැඩිකර තිබුණු අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පොල් සැපයුම්කරුවන් වෙත ගිවිසුම්ගත මුදලට වඩා රු.7,518,132 ක් වැඩිපුර ගෙවා තිබුණි. මීට අමතරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත අමු පොල් මිලදී ගැනීමට වාර්ෂික ඇස්තමේන්තු

මගින් වෙන්කර තිබු මුදල රු.26,881,824 ක් වුවත් ඊට අමතරව 2017 වර්ෂයේදී රු.48,570,821 ක මුදලක් පිටිකල පොල්කිරි මිලදී ගැනීම සඳහාද වැයකර තිබුණි. තවද කඳවුරු 07 ක් හැර අනෙකුත් සියළුම කඳවුරු සඳහා අමුපොල් සැපයීම සඳහා ඉකුත් වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව කොන්ත්‍රාත්තු ලැබී තිබුණේ එකම පෞද්ගලික සමාගමකට විය.

## 2.4 වත්කම් කළමනාකරණය

---------------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහන උපයෝජනය

------------------------

2016 සහ 2017 යන වර්ෂවලදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මෝටර් වාහන අපහරණය කිරීමේදී තක්සේරු මිලට වඩා අඩු වටිනාකමකට මෝටර් වාහන 44 ක් විකිණීම හේතුවෙන් රු.3,794,200 ක පාඩුවක් සිදුවී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද එම වාහන අපහරණය සම්බන්ධ තොරතුරු ඇතුලත් ලිපිගොනු විගණනය සඳහා ලැබී නොතිබුණි.

### (ආ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

(i) හිගුරක්ගොඩ ගුවන් හමුදා කඳවුරේ ගොඩනැගිලි සිවිල් ඉංජිනේරු අංශයට අයත් ගබඩා පරිශ්‍රය තුල පවතින වර්ග 09 කට අයත් තොග විෂයයන් 2446 ක් නිශ්කාර්යව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. 2010 වර්ෂයේදී මිලදී ගත් පරිශ්‍රය ආවරණය කිරීම සඳහා භාවිතා කරන ඇලුමීනියම් තහඩු කැබලි (Diamond Washer -531002200) කිලෝ 338 ක් සෙමින් නිකුත් වන තොග ලෙස පවතින බව නිරික්ෂණය විය.

(ii) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විරවිල කඳවුරේ රු.218,800 ක් වටිනා Iron Kapnail (1 1/2) ඇණ කිලෝ ග්‍රෑම් 547 ප්‍රමාණයක් වර්ෂයකට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

(iii) විගණනය සඳහා ලද තොරතුරු අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව මෝටර් වාහන 2130 ක් පැවති අතර ඉන් මෝටර් වාහන 257 ක් සමාලෝචිත වර්ෂය තුල කිසිදු ආකාරයක ධාවනයකින් තොරව වාහන අංගන තුල නිශ්ක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය. තවද වෙනත් මෝටර් වාහන 352 ක් සමාලෝචිත වර්ෂය තුල ධාවනය කර තිබුණේ කිලෝමීටර 1000 කට වඩා අඩු ප්‍රමාණයක් බවද නිරීක්ෂණය විය.

(iv) හිගුරක්ගොඩ ගුවන් හමුදා මූලික කඳවුරේ රෙදි පිළි ගබඩා පරිශ්‍රය තුල 2017 අගෝස්තු 18 දින වන විට සුදු ටී ෂර්ට් සඳහා අවශ්‍ය වූ රු.18,158,380 ක් වටිනා

රෙදි මීටර් 53,407 ක් වර්ෂ 1 1/2 කට වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවති බව භෞතික පරීක්ෂාවේදී හෙළිදරව් විය. තවද, මෙම රෙදි තොගය අවපැහැගැන්වීම නිසා භාවිතයට නුසුදුසු තත්වයෙන් පැවති බවද නිරීක්ෂණය විය. ඊට අමතරව, නිලධාරීන්ගේ නිල ඇඳුම් සඳහා අවශ්‍ය වන වර්ග 3කට අයත් රු.16,150,810 ක් වටිනා රෙදි වර්ෂ 02 සිට 05 දක්වා නිෂ්කාර්යව ඉහත ගබඩාව තුල පැවති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය

(v) ලැබී තිබුණු තොරතුරු අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව ප්‍රහාරක හා මගී ගුවන් යානා 119 ක් වූ අතර ඉන් ගුවන් යානා 62 ක් 2017 දෙසැම්බර් 31 දිනට නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

**2.5 බැදීම් හා බැරකම්**

-------------------

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

-----------------------------------------------------

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවන පරිදි වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 2,118.1ක ප්‍රතිපාදනය රු.මිලියන 58.65 කින් ඉක්මවා රු.මිලියන 64.6 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**2.6 අවිධිමත් ගනුදෙනු**

-----------------------

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදාපතිගේ ගුවන් හමුදා නියෝග අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් මෙහෙයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි. මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බව නිරීක්ෂණය විය. තවද 2016 ජූලි 29 දිනැති අංක 7/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරවශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව හා 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/15-2015 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් දක්වා ඇති පරිදි අරමුදල් සමාලෝචනය කර චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව එය නිකුත් කල දින සිට දින 14 ක් ඇතුලත රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පවත්වාගෙන යන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් අතුරින් අරමුදල් 7 ක තොරතුරු පමණක් 2016 සැප්තැම්බර් 02 දින ඉදිරිපත් කර තිබුණි. අනෙක් අරමුදල් පිළිබඳ තොරතුරු රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය විගණනය වෙත වාර්තාකර නොතිබුණි. මීට අමතරව, උක්ත අරමුදල් සම්බන්ධව වාර්ෂික විගණනයන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධායක විගණන අංශය මගින් සිදුකරනු ලබන බව ගුවන් හමුදාපති වරයා විසින් පැහැදිලි කර තිබුණු නමුත් ඒ පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2016 ක් වූ ජූනි මස 24 වන දින පැවති ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධනය සමාලෝචන කිරීම සඳහාවූ රාජ්‍ය ගිණුම්කාරක රැස්වීමේ නියෝගයන් මගින් ත්‍රිවිධ හමුදාව මෙහෙයවන අරමුදල් පොදු ප්‍රතිපත්තියක් මත විගණනයට අනුකූල වන පරිදි තවදුරටත් පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳ වාර්තාවක් සකස් කිරීමටත් රජයේ යෙදවුම් සඳහා සාධාරණ ප්‍රතිශතයක් ලැබිය යුතු බවත් අවධාරණය කරන ලදී. මේ පිළිබඳ ගෙන තිබුණු පියවර පිළිබඳ විස්තර විගණනයට ලැබී නොතිබුණි.

**2.7 පාඩු හා හානි**

----------------

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 259/2017 අනුව පිළියෙල කර ඇති පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට අනුව වර්ෂ 05 කට අඩු සිද්ධීන් 219 කට අදාල රු.958,875,319 මුදලක්ද වර්ෂ 5ත් 10 ත් අතර සිද්ධීන් 35 කට අදාලව රු.48,956,492 මුදලක්ද වර්ෂ 10 කට වැඩි සිද්ධීන් 25 කට අදාල රු. 11,891,529 ක්ද වශයෙන් මුළු සිද්ධීන් 279 කට අදාලව රු.1,019,723,340 ක්වූ මුදලක් අයකර ගැනීමට, කපා හැරීමට හෝ අත්හැරිමට ඇති පාඩු ලෙස වාර්තා කර තිබුණි.

**2.8 හානි පිළිබඳ වගකීම**

---------------------

කටුනායක මූලික ගුවන් හමුදා කඳවුරෙහි ගුවන් යානා අමතර කොටස් අංශයේ රේඩාර් රිසිවරයක් (LRU 02) සහ ඇන්ටනා ස්කැනරයක් (LRU 01) 2014 අප්‍රේල් 25 වන දින අළුත්වැඩියා කටයුතු සඳහා චීනයට යවා තිබුණු නමුත් ප්‍රවාහනය අතරතුරදී ඉහත භාණ්ඩ අස්ථානගත වීම හේතුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට රු.74,457,100 ක අලාභයක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම අලාභය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් 2015 අගෝස්තු 31 දින ඉදිරිපත් කර තිබුණු අතර අලාභයේ වටිනාකම වගකිවයුතු පාර්ශවයන් හදුනාගෙන අයකර ගැනීමට මෙම වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණු බව විගණනයේදී අනාවරණය විය.

**2.9 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම**

------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 27,864.665 | 27,641.065 | 223.600 | 0.80 |
| | මූලධන | 17,032.925 | 6,577.690 | 10,455.235 | 61.38 |
| | **එකතුව** | **44,897.590** | **34,218.755** | **10,678.835** | **23.78** |
| 2014 | පුනරාවර්තන | 30,936.593 | 30,253.381 | 683.212 | 2.20 |
| | මූලධන | 12,878.670 | 12,357.124 | 521.546 | 4.04 |
| | **එකතුව** | **43,815.263** | **42,610.505** | **1,204.758** | **2.75** |
| 2015 | පුනරාවර්තන | 33,876.500 | 32,281.396 | 1,595.104 | 4.70 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන | 19,298.000 | 17,244.174 | 2,053.826 | 10.64 |
| | **එකතුව** | **53,174.500** | **49,525.570** | **3,648.930** | **6.86** |
| 2016 | පුනරාවර්තන | 33,994.752 | 31,059.023 | 2,935.729 | 8.63 |
| | මූලධන | 19,659.000 | 4,401.146 | 15,257.854 | 77.61 |
| | **එකතුව** | **53,653.752** | **35,460.169** | **18,193.583** | **33.90** |
| 2017 | පුනරාවර්තන | 33,182.623 | 32,278.744 | 903.879 | 2.72 |
| | මූලධන | 8,642.885 | 5,533.730 | 3,109.155 | 35.97 |
| | **එකතුව** | **41,825.508** | **37,812.474** | **4,013.034** | **9.59** |

**(අ) විසර්ජන ගිණුම**

**----------------**

පහත සඳහන් කිරික්ෂණයන් කරනු ලැබේ.

**(i) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

**----------------------------**

වැය විෂයයන් 33 ක් සඳහා එකතුව රු.මිලියන 2,748 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 4,716 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක වී තිබුණි. ලබාදී ඇති පිළිතුර අනුව බිල්පත් ප්‍රමාද වීම, ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම, මිලදී ගැනීම් එම වසර තුලදී සිදුනොවීම, විදේශ රටවල තාක්ෂණ උපදේශ මත කරනු ලබන ගුවන් යානා අලුත්වැඩියා සමාලෝචිත වර්ෂය තුල නිම නොවීම යන කරුණු මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට බලපා තිබුණි.

**(ii) වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

**------------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත වූ කාර්යයන් සම්බන්ධයෙන් වෙනත් අමාත්‍යාංශ 04 ක් හා දෙපාර්තමේන්තු 02 ක්,විසින් එකතුව රු.මිලියන 1,117.74 ක මුදලක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත මාරුකර දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 932.46 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 185.28 ක් හෙවත් සියයට 16.58 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.10 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 2 ක් සඳහා එකතුව රු.මිලියන 2847 ක්වූ ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 3,150.2 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 110.6 ක් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) 20.03.02.16 දරන ආදායම් සංකේතය - ගුවන් යානා කුලී ආදායම**

**--------------------------------------------------------------------------**

(i) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. මිලියන 14.22 ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 1 සිට වර්ෂ 11 ක් අතර කාල පරාසයකට අදාළ විය. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 03 ක ශුද්ධ ආදායම් රැස්කිරීම සම්බන්ධයෙන් සලකා බැලීමේදී 2014 වර්ෂයේ ගුවන් යානා කුලී ආදායම රු.මිලියන 248.7 වූ අතර එම ආදායම ක්‍රමයෙන් පිරිහෙමින් පැවති අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 147.2 ක් දක්වා සියයට 40.80 කින් ආදායම පහල ගොස් තිබුණි.

**(ආ) 20.03.06.00 දරන ආදායම් සංකේතය -එක්සත් ජාතින්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරිය**

**---------------------------------------------------------------------------------------------**

(i) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව ඇ.ඩොලර් මිලියන 2.71ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 1 සිට වර්ෂ 5 ක් අතර කාල පරාසයකට අදාළ විය. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) මු.රෙ.128 (2) (ඇ) ප්‍රකාරව හිග ආදායම් සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා අදාල කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසය තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට අදාලව සකස් කල හිග ආදායම් වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 මාර්තු 13 වන දින දීය.

**2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**-----------------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-----------------------------------------------------------**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට විෂය අංක 22401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 550 | 458.347 | 418 | 421.489 | 1,000 | 306.599 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 16,094,133 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 5 ට වැඩි දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.12 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය /මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය | ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලින කර නොතිබුණි. |
| (ii) පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

**2.13 අනුකූල නොවීම්**

**2.13.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මු.රෙ.104 (4) | | ගුවන් ගමන් සේවා සඳහා අමාත්‍යාංශ 7 කින් අයවීමට තිබූ මුදල කපා හැරීමට නිර්දේශ කර තිබුණි |
| (ii) මු.රෙ.104(3) | 3,742,077 | සිද්ධීන් 69 ක් සම්බන්ධයෙන් සිදුවූ අලාභය පිළිබඳ දින 7 ක් ඇතුලත වාර්තා කිරීමක් හෝ පොදු 283 ආකෘතිය අනුව මූලික වාර්තා කිරීමක් කර නොතිබුණි. |
| | 135,021,939 | |

**2.14 තිරසර සංවර්ධනය**

**තිරසර අරමුණු ළගා කර ගැනීම**

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් හමුදාව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන, අරමුණු, ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානය සහ ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයක්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවැතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළගාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ)** තිරසර ඉලක්ක කරා ළගා වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබුණි.

## 2.15 මානව සම්පත් කළමනාකරණය

### 2.15.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 26,469.5 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.673,011 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 07 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 03 | |
| (iii) | ද්විතියික මට්ටම | 184 | 92 | 92 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 3,019 | 2,458 | 561 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 740 | 301 | 439 |
| (vi) | සේවා නිලධාරී | 2,156 | 1,945 | 211 |
| (vii) | සෙසු නිල | 35,844 | 34,524 | 1,320 |
| | | 41,954 | 39,330 | 2,624 |